තෛපොංගල් උත්සවය ආශ්‍රිත චිත්‍රමය අංග හඳුනා ගනිමු.

■ තෛපොංගල් උත්සවය හින්දු භක්තිකයන්ගේ ප්‍රධාන ආගමික උත්සවයකි.

■ දමිළ අවුරුදු ක්‍රමය අනුව වසරේ පළමුවන මාසය සඳහා ''තෛ'' යන නාමය භාවිත වේ.

■ එය ජනවාරි ''තෛ'' මාසයේ  මාසයේ 14 හෝ 15 දින පැවැත්වේ.

■ අලුත් සහල් අලුත් මැටි මුටටියක දමා පිළියෙල කර කිරි ඉතිරවීම "පොංගල්" යනුවෙන් හැඳින්වේ.

■ උත්සවය පැවැත්වීමට පෙර ගෙබිම පිරිසිදු කොට ප්‍රධාන දොරටුවට බද්ධවන සේ හිටවන ලද කෙසෙල් ගස් දෙකකින් තොරණක් සාදනු ලබයි.

■ පිරිසිදු කරගත් ගෙබිම මැද කහ කුඩු සහ සහල් පිටිවලින් කෝලම් රටා නිර්මාණය කරයි.

■ එකී කෝලම් රටාවේ මැද ලිපක් බැඳ කිරිබත් පිස පුද පූජාවන් කරනු ලබයි.

■ කෝලම් රටාව මැද පූර්ණ කුම්භ සාදා පහනක් තබා කිරිබත් පිළියෙල කොට හිරු නැග එත්ම කිරි, උක්, හකුරු, පලතුරු සහ වී තබා හිරු දෙවියන්ට පූජා කරනු ලැබේ.

(මෙම උත්සවයට අදාළව රූප සටහන් අලවන්න .)

පැවරුම

■ පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. තෛපොංගල් උත්සවය වැදගත් වන්නේ ඇයි ?
2. තෛපොංගල් උත්සවය විචිත්‍රවත් කරන සැරසිලි හඳුන්වන්න.
3. තෛපොංගල් සැරසිලි සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය කිහිපයක් නම් කරන්න.
4. මෙම උත්සවයේ දී හින්දුන් විසින් අනුගමනය කරන පූජා විධි මොනවාද?
5. තෛපොංගල් උත්සවයේ දී හින්දුන් තුළ වර්ධනය වන ආකල්ප මොනවාද ?
6. තෛපොංගල් උත්සවයේදී ගෙබිම අලංකාර කරන  කෝලම් රටාවක් ඇඳ වර්ණවත් කරන්න.

# දානය, දයාව පිරි රාමසාන් උත්සවය

■ රාමසාන් උත්සවය (ඊදුල් ෆිත්ර්)ඉස්ලාම් ප්‍රජාවට සුවිශේෂ වූ උත්සවයකි.

■ ඉස්ලාමීය දින දර්ශනයේ නව වන මාසය වන රමලාන් මාසයේ මුල් සඳ දුටු තැන් සිට දසවන මාසය වන ෂව්වාල් මාසයේ මුල් සඳ දක්වා දින 29 හෝ 30 ක් උපවාස කාලයකින් පසුව රාමසාන් උත්සවය එළඹේ.

■ මෙකී උපවාස කාලය තුළ ලොව පුරා විසිරී සිටින මුස්ලිම් බැතිමත්හු ඉතා අධික භක්තියෙන් යුතු ව උපවාසයේ නියැලෙති.

■ මෙකී උපවාසය "සව්ම්" යන අරාබි වහරෙන් හඳුන්වනු ලැබේ.

■ උපවාසයේ දී අලුයම නැමදුම් (සලාත්) වේලාව ආරම්භ වීමට සුළු මොහොතකට පෙර සිට හිරු බැසයන කාලය වන තුරු කිසිදු ආහාරපාන ගැනීමක්, උපවාසය කඩවන දෙයක් කිරීමක් සිදු නොවේ.

■ සව්ම් සමාදන් (උපවාසයේ යෙදීම) මගින් කුසගින්නේ කුරිරු බව අවබෝධ වීම නිසා දිළින්දන්ට පිහිටවීමේ ආකල්ප ඇතිවනවා පමණක් නොව ඔවුහු එය ක්‍රියාවට නැංවීමට ද පෙළඹෙති.

■ එහෙයින් මෙම කාලයේ බහුල වශයෙන් "('සකාත් )යන අනිවාර්ය දානය ද "සදකා" යන අනිවාර්ය නොවන දානය ද මුස්ලිම්වරු විසින් දෙනු ලැබේ.

■ "සව්ම්" නොහොත් උපවාසයේ යෙදීමේ දී සිත දමනය කර ජීවත් වීමට පුහුණුවක් ද ඉවසීමෙන් ජීවත් වීමේ හැකියාව ද ලැබේ. එමෙන් ම මෙමගින් මනුෂ්‍යා තුළ යහපත් ගුණදහම් වර්ධනය වන අතර යහපත් විනයක් පවත්වා ගැනීමට ද පුහුණුවක් ලැබේ.

■ වයස අවු 10 ට වැඩි සියලුම් මුස්ලිම් පිරිමින් හා ස්ත්‍රීන්ට උපවාසය රැකීම අනිවාර්ය වේ. එහෙත් කුඩා දරුවන්, රෝගීන්, වයෝවෘධයන්, ගැබිනි මව්වරුන් හා කිරිදෙන මව්වරුන් සඳහා සහන/ විකල්ප ඇත.

■ මුස්ලිම්වරු උපවාසයේ යෙදෙන කාලයේ වැඩි වශයෙන් යාඥා කරමින් (විශේෂයෙන්ම රාත්‍රී කාලයේ) හා ශුද්ධ වූ 'කුර්ආනය' පාරායනයේ (කියවමින්) පසුවෙති. 'අල්ලාහ්' දෙවියන්ගෙන් මේ සඳහා අධික ආනිශංස ලැබෙන බව ඔවුන්ගේ විශ්වාසයයි.

■ නව සඳ දැකීමෙන් පසු උපවාස කාලය අවසන් වේ.

■ උපවාස කාලය අවසන් වීමත් සමග මස්ජිදයට (දේවස්ථානයට) ගොස් යාඥා කර රාමසාන් උත්සවය පැවැත්වීම මුස්ලිම් ජනතාවගේ ප්‍රධාන කාර්යයක් වෙති.

■ රාමසාන් උත්සව දිනයේ කෙරෙන මහත් සත්ක්‍රියාවකි "සකාතුල් ෆිත්රා" නම් දානය දීම.

■ පවුලේ සංඛ්‍යාව අනුව එක් අයෙකුට 2 නට බැගින් පස් දෙනෙකු සිටීනම් 10 නට දන් දිය යුතුයි.

■ එම දානය දිය යුත්තේ පසුදා උදය නැමදුම අවසන් වීමට පෙරය.

පැවරුම

■ පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඉස්ලාමීය දින දර්ශනයේ නව වන මාසය හඳුන්වන්නේ කුමන නමකින්ද ?
2. මුස්ලිම් බැතිමත්හු ඉතා අධික භක්තියෙන් යුතු ව නිරත වන උපවාසය කුමන නමකින් හැඳින්වේද ?
3. මුස්ලිම් බැතිමත්හු සව්ම් සමාදන් (උපවාසයේ යෙදීම) මගින් සිදු කරනු ලබන්නේ කුමක්ද ?
4. අනිවාර්ය දානය හා අනිවාර්ය නොවන දානය හඳුන්වන්නේ කුමන නමකින්ද ?
5. උපවාසය රැකීම අනිවාර්ය නොවන්නේ කුමන පිරිසකටද ?
6. මුස්ලිම්වරු උපවාසයේ යෙදෙන කාලයේ වැඩි වශයෙන් යාඥා කරන්නේ කුමන ග්‍රන්ථයද ?
7. උපවාස කාලය අවසන් කරනු ලබන්නේ කෙසේද ?
8. උපවාස කාලය අවසන් වීමත් සමඟ සිදුකරනු ලබන්නේ කුමක්ද ?
9. රාමසාන් උත්සව දිනයේ කෙරෙන මහත් සත්ක්‍රියාවක කුමන නමකින් හැඳින්වේද ?
10. රාමසාන් උත්සව දිනයෙන් පසුව දෙනු ලබන දානය දිය යුත්තේ කුමන කාලයට පෙරද ?

## හින්දු කෝවිලක මූලිකාංග හා එහි කලා නිර්මාණ

"කෝවිල හින්දු ආගමික ගොඩනැගිල්ලකි.

එහි බිම් සැලැස්ම ප්‍රධාන කොටස් හතරකින් සමන්විතය.

ගෝපුර, මණ්ඩප, ප්‍රදක්ෂිණා පථය සහ ගර්භ ගෘහය යනුවෙනි. "

හින්දු කෝවිලක ප්‍රධානම ගෘහ නිර්මාණ අංගය වන්නේ එහි පිවිසුම් දොරටුව වන 'ගෝපුරම්' හෙවත් 'ගෝපුර'යි.



මෙහි මූර්තිමය නිර්මාණ රැසක් දැක ගත හැකිය.

හින්දු ආගමික සාහිත්‍යයේ එන විවිධ සිද්ධී හා චරිත මෙම මූර්ති නිර්මාණවලින් නිරූපණය වේ. "

හින්දු ආගමික ගොඩනැගිල්ල විමාන අට්ටාල සිලින්ඩරාකාර පැන්නුම් කුලුනුවලින් යුක්ත වේ. "





ශිව දෙවියාගේ වාහනය වන 'නන්දි' ගවයාගේ රුව බොහෝ හින්දු දේවාල තුළ දැක ගත හැකි අතර එය බොහෝ විට කළු ගලින් නිමවා ඇත. "



ශ්‍රී ලංකාවේ හින්දු ආගමික ගෘහ නිර්මාණ කලාව කෙරෙහි බලපා ඇත්තේ දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ කලාව වේ. "


හින්දු ආගමික සංකේතය ලෙස භාවිත කරන්නේ වෘෂභ කොඩියයි. "




හින්දු දේවාලයේ 'ගර්භ ගෘහ'නමින් හඳුන්වන කොටසෙහි කුඩා

හින්දු දේවාලයක හැඩයගත් ආකෘතිමය කලා කෘතියක් වේ.


# හින්දු කෝවිල




## හින්දු කෝවිලක බිම් සැලැස්ම




1. ගෝපුරම්
2. මණ්ඩපය
3. ප්‍රදක්ෂිණා පථය
3. ගර්භ ගෘහය



<u>ඉස්ලාම් පල්ලියක (මස්ජිදය) මූලිකාංග හා එහි කලා නිර්මාණ</u>

මුස්ලිම් (ඉස්ලාම්) පල්ලිය - මස්ජිදය ‟

අරාබියේ සිට ලංකාවට මුස්ලිම්වරු පැමිණිමේ ප්‍රතිඵලයක් ලෙස මුස්ලිම් මස්ජිද ලංකාවේ ඇතවිය. ‟

උල් වූ තුඩක් සහිත ගෝලාකාර විශාල ශිඛරය එහි විශේෂ ගෘහ නිර්මාණ අංගයයි. එය කුඟා ලෙස හැඳින්වේ.



‟

පල්ලිය ඉදිරිපිට පිහිටුවා ඇති පොකුණ ද පල්ලියට පිවිසෙන දොරටුව මැදිකර තනා ඇති තොරණ ද පල්ලිය ආශ්‍රිත විශේෂ නිර්මාණාංග වේ. ‟

මෙයට අමතරව මුස්ලිම් පල්ලියේ දෙපස ඉදිකර ඇති කුලුනු ද එහි ගෘහ නිර්මාණාංගවලට අයත් ය. ඒවා මිනාර් හෙවත් මිනරෙට් යනුවෙන් හඳුන්වයි.

මෙම කුලුනු මුදුන්වල ගෝලාකාර ශිඛර දැකගත හැකි ය. ‟



සෑම කුලුනකම මුදුනෙහි අඩ සඳ හා තාරකා සංකේත මූර්තිමත් කර ඇත.



මුස්ලිම් පල්ලිවල චිත්‍ර හා ප්‍රතිමා නිර්මාණ දක්නට නොලැබේ. ‟



ඉස්ලාම් ආගමික ග්‍රන්ථය වන කුරානයේ ඇති පාඨ අරාබි බසින් පල්ලියේ බිත්ති මත සටහන් කර ඇත. මෙම පාඨ අත් අකුරු ලිවීමේ කලාවට (Calligraphy) අනුව විවිධ හැඩ මතුවන සේ අක්ෂර කලාත්මකව නිර්මාණය කර ඇත.

